# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2403/16 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය : WGSWD&EIP/ACQ/KB/33.*
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/10/2016/LRB/67.*

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, කරදියාන කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය හා වේරස් ගඟට යාබදව පිහිටි ඉඩම් කොටස් ජල රැඳවුම් කලාපයක් ලෙස පවත්වා ගැනීමට හා ව්‍යාපෘතිය යටතේ අවතැන්වන්නන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය :*

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 576ජ්, තුම්බෝවිල උතුර ග්‍රාම නිළධාරි වසමේ තුම්බෝවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521203 කළාප අංක 16 පත්‍ර අංක 05 හා 2021/04/07 දිනැති කැඩැස්තර සිතියමේ පහත අංකනය කර පෙන්වා ඇති ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 196**

ඉඩමේ නම: දුනුහිංග කුඹුර, කරදියාන කුඹුර සහ මාවීකොටුව; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සාරිකා අල්විස් වීරක්කොඩි මිය, රුවනි දිල්හාරි අල්විස් වීරක්කොඩි මිය, චමරි උදයංගනී අල්විස් වීරක්කොඩි මිය, අංක - 82, ඇල්හේන පාර, මහරගම; ප්‍රමාණය: හෙක්. 0.3160.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලි වලින් බලයලත් අයවලුන් හෝ **2024 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව.10.00** ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2024 ඔක්තෝබර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිළධාරී,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03. ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 09-0159


PG 6882 - 14 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.